# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව "සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්" යන තේමාව යටතේ උතුරු පළාත තුළ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මාර්ග දැක්මන් පවත්වයි.

"සුරක්ෂිත අනාගතයක් සඳහා සැමට රක්ෂණයක්" යන තේමාව යටතේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රක්ෂණ කරුවන්ගේ සංගමයේ, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සහාය ඇතිව 2025 ඔක්තෝබර් මස 22 වන දින යාපනයේදී සහ ඔක්තෝබර් මස 23 වන දින කිලිනොච්චියේදී පැවති වැඩසටහන් සමගින් උතුරු පළාත තුළ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව සාර්ථකව අවසන් කරන ලදී. මෙම වැඩසටහන්, මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමටත් රක්ෂණය කෙරෙහි යොමුවීම ඉහළ නැංවීමටත් රක්ෂණය කෙරෙහි මහජන විශ්වාසය ගොඩනැගීමටත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිවයින පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන මුලපිරීම්වල එක් පියවරකි.

සියලුම බලපත්‍රලාභී ජීවිත හා සාමාන්‍ය රක්ෂණ සමාගම්වල කාර්ය මණ්ඩලයේ සක්‍රීය සහභාගීත්වයෙන් යුතුව රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ග දැක්මක් (Roadshow) සමගින් යාපනය දිස්ත්‍රික් වැඩසටහන ආරම්භ විය. මෙම මාර්ග දැක්මෙහි අරමුණ වූයේ ජීවිත, සෞඛ්‍ය, වාහන සහ දේපළ සඳහා රක්ෂණයේ ඇති ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම මෙන්ම රක්ෂණාවරණ ලබා ගන්නා අනාගත ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමයි.

මාර්ග දැක්මෙන් පසුව තිරුවල්ලුවර් සංස්කෘතික මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් පවත්වන ලදී. උදැසන වැඩමුළුව මගින් රජයේ නිලධාරීන්, බැංකුකරුවන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සහ සාමාන්‍ය මහජනතාව ඉලක්ක කරමින් ජීවිත රක්ෂණය, මෝටර් රක්ෂණය සහ මෝටර් නොවන රක්ෂණය, අග්‍රහාර, වැනි රක්ෂණ යෝජනා ක්‍රම සහ මෝටර් රථ අනතුරු හේතුවෙන් තෙවන පාර්ශවීය වින්දිතයන් සඳහා වූ විකල්ප වන්දි යෝජනා ක්‍රමය පිළිබඳව දැනුම ලබාදෙන ලදී. පස්වරු වැඩමුළුව පාසල් හා විශ්වවිද්‍යාල සිසුන් ඉලක්ක කර ගත් අතර රක්ෂණය පිළිබඳ දැනුමට අමතරව වෘත්තීය මාර්ගෝපදේශ, පාසල් ළමුන් සඳහා සුරක්ෂා රක්ෂණාවරණය සහ රක්ෂණ අංශය තුළ පවතින රැකියා අවස්ථාවන් පිළිබඳව එහිදී පැහැදිලි කෙරිණි. සහභාගී වූ සෑම රක්ෂණ සමාගමක් විසින් තොරතුරු ලබා දීමට සහ ජීව දත්ත පත්‍රිකා භාර ගැනීමට වෘත්තීය මාර්ගෝපදේශ කවුන්ටරයක් පවත්වාගෙන යන ලදී.
යාපනයේ පැවති වැඩසටහන සඳහා 1,200 ක් පමණ පිරිසක් සහභාගී වූ අතර ඔවුන්ට කර්මාන්ත නියෝජිතයන් සමග සෘජුව සම්බන්ධ වීමේ අවස්ථාව උදා විය.

කිලිනොච්චි දිස්ත්‍රික් වැඩසටහන ආරම්භ වූයේ පොලිස් ස්ථානය අසල පැවති රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ග දැක්ම සමගිනි. එහිදී සහභාගී වූ සියළුම රක්ෂණ සමාගම්වල නියෝජිතයෝ අන්තර්ක්‍රියාකාරී ප්‍රදර්ශනය කිරීම්, ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ඔස්සේ මහජනතාව සමග සෘජුව සම්බන්ධ වූහ. ඉන් අනතුරුව, ආර් එස් ග්‍රීන් භාරතී රිසෝට් ශාලාවේදී රජයේ නිලධාරීන්, බැංකුකරුවන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සහ සාමාන්‍ය ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී. කිලිනොච්චි වැඩසටහන සඳහා 500 ක පමණ පිරිසක් සහභාගී වූ අතර එය මාර්ග දැක්ම, වැඩමුළුව සහ වෘත්තීය මාර්ගෝපදේශ අවස්ථා ඒකාබද්ධ කරමින් යාපනයේ පැවැත්වූ වැඩසටහනට සමාන වැඩසටහනක් ලෙස පැවැත්විණි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමා ස්ථාන දෙකෙහිම පැවැත්වූ දේශනවලදී රක්ෂණය යනු අවදානම් කළමනාකරණය කිරීම සහ ආරක්ෂාව හා ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා වන ප්‍රධාන මූල්‍ය මෙවලමක් බව අවධාරණය කළේය. තම ආදරණීයයන් සුරක්ෂිත කිරීම, ආදායම ප්‍රතිස්ථාපනය කිරීම සහ විශ්‍රාම දිවිය සැලසුම් කිරීම සඳහා ජීවිත රක්ෂණයේ ඇති ප්‍රතිලාභ මෙන්ම, අනතුරු, ස්වාභාවික විපත් සහ වාහන අනතුරුවලින් ආරක්ෂා වීම සහ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා සාමාන්‍ය රක්ෂණයේ ඇති වැදගත්කම ඔහු ඉස්මතු

කළේය. විවිධ මූල්‍ය හැකියාවන්ට ගැලපෙන ලෙස වාරික මුදල් සකස් කළ හැකි බවත් එමගින් රක්ෂණාවරණය සැමට ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි තත්ත්වයට පත් වන බවත් සභාපතිතුමා වැඩිදුරටත් අවධාරණය කළේය.

මෙම වැඩසටහන් හරහා, දැනුවත් කිරීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම මගින් රක්ෂණය සම්බන්ධයෙන් වන මහජන විශ්වාසය සහ පැහැදීම වැඩි කිරීම කෙරෙහි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අඛණ්ඩව අවධානය යොමු කරයි. ඉදිරියේදී ගැනීමට නියමිත මූලපිරීම් පිළිබඳව ද කොමිෂන් සභාව මෙහිදී සිය කැපවීම නැවත අවධාරණය කළේය. ඒවා නම්:

- ඊ-කාඩ්පත් ('e-cards') හඳුන්වාදීම තුළින් මෝටර් වාහන රක්ෂණය ඩිජිටල්කරණය කිරීම.
- ණය තොරතුරු කාර්යාංශය සමග සහයෝගයෙන් රක්ෂණ දත්ත සුරක්ෂිතාගාරයක් (Insurance Data Repository) සංවර්ධනය කිරීම.
- දැරිය හැකි, ඉහළ ප්‍රතිලාභ සහිත, සරළ සම්මත රක්ෂණ නිෂ්පාදන හඳුන්වාදීම.
- 2026 ජනවාරි 01 දින සිට වාරික ගෙවීමේ වගකීම් කාලය දින 30ක් දක්වා අඩු කිරීම.

මෙම වැඩසටහන් සාර්ථකව නිම කිරීමට සක්‍රීය සහයෝගය ලබා දුන් යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම්වරුන්, සියලුම රජයේ නිලධාරීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්, යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා සහ කාර්ය මණ්ඩලය , සියලුම සහභාගිවන්නන් , රක්ෂණ සමාගම්, කර්මාන්ත පාර්ශ්වකරුවන් සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය වෙත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිය කෘතඥතාව පුද කරන අතර මෙම මූලපිරීම් ශ්‍රී ලංකාව පුරා මූල්‍යමය වශයෙන් දැනුවත්, රක්ෂණය කරන ලද සහ සුරක්ෂිත මාජයක් නිර්මාණය කිරීමේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි මෙහෙවරේ වැදගත් පියවරක් සනිටුහන් කරයි.

සෑම ශ්‍රී ලාංකිකයෙකුටම දැනුවත්ව රක්ෂණ තීරණ ගැනීමට අවශ්‍ය දැනුම සහ මෙවලම් වෙත වන ප්‍රවේශය සහතික කරමින්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් දිවයින පුරා ක්‍රියාත්මක දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව ලබන වසරේදී අනෙකුත් පළාත් දක්වා ද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත.

**ඡායාරූප**
























3rd
Life
General

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, 11 වන මහල,**
**නැගෙනහිර කුළුණ,**

**ලෝක වෙළඳ මධ්‍යස්ථානය,**
**කොළඹ 01**

| | |
|---|---|
| වෙබ් අඩවිය: www.ircsl.gov.lk | ඊමේල්: info@ircsl.gov.lk |
| දුරකථනය: 011 2396184 - 9 | ෆැක්ස්: 011 2396190 |


**දිනය:** 2025/10/28